අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව අංකය இல. My Ref. ED/09/12/06/14

ඔබේ යොමුව අංකය உமது இல. Your Ref.

දිනය திகதி Date 2026.10. 28

චක්‍රලේඛ අංක - 32/2026

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්
සියලු ම රජයේ සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව පාසල් කාලසටහන සකස් කිරීම

2026.09.28 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සංශෝධිත ජාතික විෂයමාලා රාමුව අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව පාසල් කාලසටහන සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, 1998 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබූ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ව්‍යුහය, මූලිකාංග සහ ඊට පසු වර්ෂවල දී හඳුන්වා දෙන ලද නවාංග තවදුරටත් ක්‍රියාත්මක වන අතර, 1 ශ්‍රේණිය සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට අදාළ ව පාසල් කාලසටහන සකස් කිරීමේ දී මින් ඉදිරියට මෙම චක්‍රලේඛයෙහි උපදෙස් බලපවත්වනු ඇත.

තව ද, ද්විතීයික ශ්‍රේණි (6 - 11) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව මින් පෙර නිකුත් කර ඇති 2025.11.04 දිනැති අංක 34/2025, 2017.12.29 දිනැති අංක 01/2018, 2015.12.13 දිනැති අංක 10/2015, 2016.04.01 දිනැති අංක 16/2014/(1), 2014.05.16 දිනැති අංක 16/2014, 2010.08.26 දිනැති අංක 2010/27, 2008.09.15 දිනැති අංක 2008/12 (1), 2008.04.21 දිනැති අංක 2008/12, 2007.03.07 දිනැති අංක 2007/06 හා 2006.03.07 දිනැති අංක 2006/09 යන සියලු ම චක්‍රලේඛ සහ 2026.01.14 දිනැති අංක ED/09/12/06/14, 2026.01.02 දිනැති අංක ED/17/03/01/01/01, 2025.12.16 දිනැති අංක ED/09/55/02/11, 2025.12.15 දිනැති අංක ED/17/03/01/01/01, 2025.11.04 දිනැති ED/16/01/05/10 - II වෙළුම සහ 2025.10.22 දිනැති අංක ED/17/03/01/01/01 දරන උපදෙස් ලිපි අවලංගු කරන අතර, 2027 වර්ෂයේ සිට ඉදිරියට මෙම චක්‍රලේඛයෙහි උපදෙස් බලපවත්වනු ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දෙන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ දී ප්‍රාථමික අංශයේ 1 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කරන ලද අතර, 2027 වර්ෂයේ දී ප්‍රාථමික අංශයේ 2 ශ්‍රේණිය සහ කනිෂ්ඨ ද්විතීයික අංශයේ 6 ශ්‍රේණිය සඳහා හඳුන්වා දී ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබේ.

ගරු අමාත්‍යතුමිය கௌரவ அமைச்சர் Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් செயலாளர் Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ පියවර පහත වගුව මගින් ඉදිරිපත් කෙරේ.

වර්ෂය	නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ලබන ශ්‍රේණිය/ශ්‍රේණි
2026	1 ශ්‍රේණිය
2027	2 සහ 6 ශ්‍රේණි
2028	3 සහ 7 ශ්‍රේණි
2029	4, 8 සහ 10 ශ්‍රේණි
2030	5, 9 සහ 11 ශ්‍රේණි
2031-2032	12 ශ්‍රේණිය
2032-2033	13 ශ්‍රේණිය

2.0 ප්‍රාථමික (1-5) ශ්‍රේණි, කනිෂ්ඨ ද්විතීයික (6-9) ශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10-13) ශ්‍රේණි සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

2.1 ප්‍රාථමික ශ්‍රේණි (1–5) නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2026 වර්ෂයේ දී 1 ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද අතර, 2027 වර්ෂයේ දී 2 ශ්‍රේණිය සඳහා ද, 2028 වර්ෂයේ දී 3 ශ්‍රේණිය සඳහා ද, 2029 වර්ෂයේ දී 4 ශ්‍රේණිය සඳහා ද, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහා ද හඳුන්වා දෙනු ලැබේ.

2.2 එය පහත සඳහන් වගුව මගින් ඉදිරිපත් කෙරේ.

ශ්‍රේණිය / වර්ෂය	1	2	3	4	5
2026	NS	OS	OS	OS	OS
2027	NS	NS	OS	OS	OS
2028	NS	NS	NS	OS	OS
2029	NS	NS	NS	NS	OS
2030	NS	NS	NS	NS	NS

NS - නව විෂයමාලාව OS - පැරණි විෂයමාලාව

2.3 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6 – 9) සඳහා හඳුන්වා දෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2027 වර්ෂයේ දී 6 ශ්‍රේණිය සඳහා ද, 2028 වර්ෂයේ දී 7 ශ්‍රේණිය සඳහා ද, 2029 වර්ෂයේ දී 8 ශ්‍රේණිය සඳහා ද, 2030 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ද ක්‍රියාත්මක කෙරේ.

2.4 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 – 11) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2029 වර්ෂයේ දී 10 ශ්‍රේණිය සඳහා ද, 2030 වර්ෂයේ දී 11 ශ්‍රේණිය සඳහා ද හඳුන්වා දීමට නියමිත අතර, එම නව විෂය නිර්දේශය හදාරන සිසුන් ප්‍රථම වරට 2030 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ය.

2.5 එය පහත සඳහන් වගුව මගින් ඉදිරිපත් කෙරේ.

ශ්‍රේණිය / වර්ෂය	6	7	8	9	10	11
2027	NS	OS	OS	OS	OS	OS
2028	NS	NS	OS	OS	OS	OS
2029	NS	NS	NS	OS	NS	OS
2030	NS	NS	NS	NS	NS	NS

NS - නව විෂයමාලාව OS - පැරණි විෂයමාලාව

2.6 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (12 – 13) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2031 වර්ෂයේ දී 12 ශ්‍රේණිය සඳහා හඳුන්වා දීමට නියමිත අතර, එම නව විෂය නිර්දේශය හදාරන සිසුන් ප්‍රථම වරට 2033 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ය.

2.7 ප්‍රාථමික ශ්‍රේණිවල 2027 වර්ෂයේ දී 3, 4 සහ 5 ශ්‍රේණි සඳහා ද, 2028 වර්ෂයේ දී 4 සහ 5 ශ්‍රේණි සඳහා ද, 2029 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහා ද, පැරණි විෂයමාලාව ක්‍රියාත්මක වේ.

2.8 ද්විතීයික ශ්‍රේණිවල 2027 වර්ෂයේ දී 7, 8, 9, 10, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2028 වර්ෂයේ දී 8, 9, 10, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2029 වර්ෂයේ දී 9, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2030 වර්ෂයේ දී 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2031 වර්ෂයේ දී 13 ශ්‍රේණිය සඳහා ද පැරණි විෂයමාලාව ක්‍රියාත්මක වේ.

3.0 පාසල් කාලසටහන සකස් කිරීම

3.1 ප්‍රාථමික ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම

3.1.1 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත විෂය සහ සතියකට වෙන් වන කාලය සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයෙහි 3.2 යටතේ සඳහන් කර ඇති උපදෙස් පරිදි, 2027 වර්ෂයේ සිට පළමු ප්‍රධාන අවධිය (1-2 ශ්‍රේණි) සඳහා නව විෂය නිර්දේශයට අදාළ ව පාසල් කාලසටහන සකස් කර ගත යුතු ය.

3.1.2 දෙවන සහ තෙවන ප්‍රධාන අවධිවලට (3-5 ශ්‍රේණිවලට) අදාළ නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2028 වර්ෂයේ දී 3 ශ්‍රේණිය, 2029 වර්ෂයේ දී 4 ශ්‍රේණිය සහ 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කෙරෙන බැවින් එක් එක් ශ්‍රේණියට අදාළ ව නව විෂයමාලාව ක්‍රියාත්මක කෙරෙන වර්ෂයේ සිට ඉදිරියට එම ශ්‍රේණි සඳහා මෙම චක්‍රලේඛයේ 3.3 සහ 3.4 යටතේ සඳහන් වන උපදෙස් අනුව පාසල් කාලසටහන සකස් කර ගත යුතු ය.

3.1.3 2027 වර්ෂයේ 3, 4 සහ 5 ශ්‍රේණි, 2028 වර්ෂයේ 4 සහ 5 ශ්‍රේණි හා 2029 වර්ෂයේ 5 ශ්‍රේණිය යන ශ්‍රේණි සඳහා පැරණි විෂය නිර්දේශය බලපැවැත්වෙන අතර එහි දී 3 සහ 4 ශ්‍රේණි 9.1හි සඳහන් උපදෙස් අනුව ද 5 ශ්‍රේණිය 9.2හි සඳහන් උපදෙස් අනුව ද පාසල් කාලසටහන සකස් කර ගත යුතු ය.

3.1.4 සියලු ම ශ්‍රේණි සඳහා මෙහි සඳහන් ආකාරයට කාලය බෙදා ගත යුතු අතර මෙම කාලය නම්‍යශීලී ලෙස භාවිත කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත. එහෙත් එක් එක් විෂය සඳහා වෙන් කරන ලද නියමිත කාලය යොදා ගැනීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

3.2 ප්‍රාථමික පළමු ප්‍රධාන අවධිය (1 සහ 2 ශ්‍රේණි) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2026 වර්ෂයේ 1 ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව 2027 වර්ෂයේ සිට ඉදිරියට 1 සහ 2 ශ්‍රේණි සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන් වන ආකාරය පහත පරිදි වන අතර එම ශ්‍රේණි සඳහා පාසල් පැවැත්වෙන කාලය පෙ.ව. 7.30 සිට පෙ.ව. 11.45 දක්වා වේ.

ඉගෙනුම් ක්ෂේත්‍ර	කාලය (සතියකට)
මව් භාෂාව	පැය 5
ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි	මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්)
දෙවන ජාතික භාෂාව	මිනිත්තු 30
ගණිතය	පැය 3 මිනිත්තු 10
ආගමික අධ්‍යයනය	පැය 1 මිනිත්තු 15
මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්	පැය 4 මිනිත්තු 35
සෞන්දර්ය ක්‍රියාකාරකම්	මිනිත්තු 50
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්)
විෂය සමගාමී ක්‍රියාකාරකම්	මිනිත්තු 30
උදෑසන රැස්වීම සහ ආගමික වතාවත්	පැය 1 මිනිත්තු 15
විවේක කාලය හා ආහාර ගැනීම	පැය 2 මිනිත්තු 30 (දිනකට මිනිත්තු 30 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 – 8.30 අතර මිනිත්තු 20ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්)
සතියකට මුළු කාලය	**පැය 21 මිනිත්තු 15**

3.3 ප්‍රාථමික දෙවන ප්‍රධාන අවධිය (3 සහ 4 ශ්‍රේණි) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව පාසල් කාලසටහන සකස් කිරීම

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව 2028 වර්ෂයේ සිට ඉදිරියට 3 ශ්‍රේණිය සඳහා සහ 2029 වර්ෂයේ සිට ඉදිරියට 4 ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන් වන ආකාරය පහත පරිදි වන අතර එම ශ්‍රේණි සඳහා පාසල් පැවැත්වෙන කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 1.00 දක්වා වේ.

ඉගෙනුම් ක්ෂේත්‍ර	කාලය (සතියකට)
මව් භාෂාව	පැය 5
දෙවන ජාතික භාෂාව	පැය 1
ඉංග්‍රීසි භාෂාව	පැය 3
ගණිතය	පැය 4 මිනිත්තු 40
ආගමික අධ්‍යයනය	පැය 2
මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්	පැය 4 මිනිත්තු 40
සෞන්දර්ය ක්‍රියාකාරකම්	පැය 1මිනිත්තු 20
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	පැය 2
විෂය සමගාමී ක්‍රියාකාරකම්	මිනිත්තු 30
උදෑසන රැස්වීම සහ ආගමික වතාවත්	මිනිත්තු 50
විවේක කාලය හා ආහාර ගැනීම	පැය 2 මිනිත්තු 30 (දිනකට මිනිත්තු 30 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 – 8.30 අතර මිනිත්තු 20ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්)
සතියකට මුළු කාලය	**පැය 27 මිනිත්තු 30**

3.4 ප්‍රාථමික තෙවන ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) සඳහා නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව පාසල් කාලසටහන සකස් කිරීම

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව 2030 වර්ෂයේ සිට ඉදිරියට 5 ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන් වන ආකාරය පහත පරිදි වන අතර 5 ශ්‍රේණිය සඳහා පාසල් පැවැත්වෙන කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 දක්වා වේ.

ඉගෙනුම් ක්ෂේත්‍ර	කාලය (සතියකට)
මව් භාෂාව	පැය 5
දෙවන ජාතික භාෂාව	පැය 1
ඉංග්‍රීසි භාෂාව	පැය 3 මිනිත්තු 30
ගණිතය	පැය 4 මිනිත්තු 40
ආගමික අධ්‍යයනය	පැය 2
මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්	පැය 6 මිනිත්තු 40
සෞන්දර්ය ක්‍රියාකාරකම්	පැය 1 මිනිත්තු 20
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	පැය 2
විෂය සමගාමී ක්‍රියාකාරකම්	මිනිත්තු 30
උදෑසන රැස්වීම සහ ආගමික වතාවත්	මිනිත්තු 50
විවේක කාලය හා ආහාර ගැනීම	පැය 2 මිනිත්තු 30 (දිනකට මිනිත්තු 30 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 – 8.30 අතර මිනිත්තු 20ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්)
සතියකට මුළු කාලය	**පැය 30**

4.0 ද්විතීයික ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම

4.1 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත විෂය සහ සතියකට වෙන් වන කාලච්ඡේද සංඛ්‍යාව සම්බන්ධ ව මෙම චක්‍රලේඛයෙහි 5.0 යටතේ සඳහන් කර ඇති උපදෙස් පරිදි, 2027 වර්ෂයේ සිට ඉදිරියට 6 ශ්‍රේණිය සඳහා පාසල් කාලසටහන සකස් කර ගත යුතු අතර, විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී 2027 සහ 2028 වර්ෂ සඳහා පමණක් මෙහි 7.0හි සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය. 2029 වර්ෂයේ සිට ඉදිරියට 6 ශ්‍රේණිය සඳහා පාසල් කාලසටහන සකස් කිරීමේ දී මෙම චක්‍රලේඛයෙහි 5.0 සහ 6.0 සඳහන් කර ඇති උපදෙස් ක්‍රියාත්මක කළ යුතු වේ.

4.2 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවලට (6 – 9) අදාළ නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2028 වර්ෂයේ දී 7 ශ්‍රේණිය, 2029 වර්ෂයේ දී 8 ශ්‍රේණිය සහ 2030 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කෙරෙන බැවින් එක් එක් ශ්‍රේණියට අදාළ ව නව විෂයමාලා ක්‍රියාත්මක කෙරෙන වර්ෂයේ සිට ඉදිරියට එම ශ්‍රේණි සඳහා ද මෙම චක්‍රලේඛයේ 5.0 සහ 6.0 යටතේ සඳහන් උපදෙස් අනුව පාසල් කාලසටහන සකස් කළ යුතු වේ.

4.3 2029 වර්ෂයේ දී 10 ශ්‍රේණිය සඳහා හඳුන්වා දීමට නියමිත නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අනුව 10 සහ 11 ශ්‍රේණි සඳහා සහ 2031 වර්ෂයේ දී 12 ශ්‍රේණිය සඳහා හඳුන්වා දීමට නියමිත නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අනුව 12 සහ 13 ශ්‍රේණි සඳහා පාසල් කාලසටහන සකස් කිරීම සම්බන්ධ උපදෙස් ඉදිරියේ දී නිකුත් කරනු ලැබේ.

4.4 2027 වර්ෂයේ දී 7, 8, 9, 10, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2028 වර්ෂයේ දී 8, 9, 10, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2029 වර්ෂයේ දී 9, 11, 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2030 වර්ෂයේ දී 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2031 වර්ෂයේ දී 13 ශ්‍රේණිය සඳහා ද මෙහි 10.0, 12.0 සහ 14.0හි සඳහන් කර ඇති උපදෙස් පරිදි පැරණි විෂය නිර්දේශයට අනුව පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

4.5 2027 වර්ෂයේ සිට පාසල්වල ක්‍රියාත්මක කළ යුතු කාලසටහන තුළ සිසුන්ට ක්‍රියාකාරකම්වල නිසි පරිදි යෙදීම සඳහා මිනිත්තු 40ක කාලච්ඡේද ඇතුළත් වන අතර දිනකට කාලච්ඡේද 8ක් වන පරිදි 6 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා සියලු ම ශ්‍රේණිවල පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

4.6 පාසල් උදෑසන රැස්වීම සඳහා සතියකට වරක් මිනිත්තු 15ක කාලයක් වෙන් කර ඇති අතර, ඉගෙනුම් ඉගැන්වීම් කාලයට බාධාවක් නොවන පරිදි; පාසල් පසුබිම, පාසල් පරිසරය සහ ක්‍රියාකාරී අවශ්‍යතා මත පදනම් ව රැස්වීමේ කාලය, ව්‍යූහය හෝ වෙනත් අදාළ කරුණු හෝ සම්බන්ධයෙන් සාධාරණ වෙනස්කම් සිදු කිරීමට පාසල්වලට හැකියාව ඇත.

4.7 සතියේ ඉතිරි දින හතරෙන් දින දෙකක්; සිසුන් සඳහා මිනිත්තු 10 බැගින් වූ ශරීර සුවතා වැඩසටහන් සැසි 02ක් ද ඉතිරි දින දෙක තුළ මිනිත්තු 10 බැගින් වූ සතිමත්භාවය පුහුණු කිරීමේ සැසියක් සහ නායකත්ව පුහුණු සැසියක් ද පැවැත්විය යුතු අතර මෙම වැඩසටහන්වලින් පසු ව, සිසුන්ට නැවත පන්ති කාමර වෙත පැමිණීම සඳහා මිනිත්තු 5ක කාලයක් හිමි වේ.

4.8 පාසල් පැවැත්වෙන දින පහේ දී පැමිණීමේ නාම ලේඛන ලකුණු කිරීම සඳහා ගුරුවරුන්ට දිනකට මිනිත්තු 5ක කාලයක් ලබා දෙන අතර, සිසුන් සහ ගුරුවරුන් සඳහා මිනිත්තු 20ක දිවා විවේක කාලයක් හිමි වේ.

4.9 ද්විතීයික ශ්‍රේණි සඳහා පාසල් පැවැත්වෙන වේලාව මෙම අමාත්‍යාංශය විසින් 2006.06.06 දිනැති ව නිකුත් කර ඇති අංක 2006/26 චක්‍රලේඛයේ සඳහන් පරිදි පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 දක්වා වේ.

5.0 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ අනුව 6-9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත විෂය සහ කාලච්ඡේද සංඛ්‍යාව

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවලට (6 – 9) අදාළ නව විෂයමාලා ප්‍රතිසංස්කරණ 2027 වර්ෂයේ දී 6 ශ්‍රේණිය, 2028 වර්ෂයේ දී 7 ශ්‍රේණිය, 2029 වර්ෂයේ දී 8 ශ්‍රේණිය සහ 2030 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කෙරෙන බැවින් එක් එක් ශ්‍රේණියට අදාළ ව නව විෂයමාලා ක්‍රියාත්මක කෙරෙන වර්ෂයේ සිට ඉදිරියට පහත පරිදි පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

විෂය	සතියකට වෙන් වන කාලච්ඡේද සංඛ්‍යාව
මව් භාෂාව සහ සාහිත්‍යය (සිංහල/දෙමළ)	5
ඉංග්‍රීසි භාෂාව	5
ගණිතය	5
විද්‍යාව	5
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	2
ආගම	2
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	2
ජීවිතය සඳහා තාක්ෂණවේදය	2
සමාජ අධ්‍යයනය (ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය)	4
දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ)	1
සෞන්දර්ය අධ්‍යාපනය	3
ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව	1
ක්‍රීඩා/සමාජ හා සංගම්/සමාජ සේවා/වෘත්තීය සූදානම සහ ජීවන කුසලතා	1
වරණීය/තෝරා ගත හැකි විෂයන්/මොඩියුල	1
පුස්තකාල/කියවීම්	1
මුළු එකතුව	**40**

6.0 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6 – 9) නව විෂයමාලාව යටතේ ක්‍රියාත්මක වන අත්‍යවශ්‍ය විෂය සහ වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල

6.1 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා මොඩියුල පාදක (Module basis) සහ සම්භාර පාදක (Credit basis) විෂයමාලාවක් හඳුන්වා දී ඇති අතර, එම නව විෂයමාලාව 2027 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

6.1.1 අත්‍යවශ්‍ය විෂය

සියලු ම සිසුන් මෙහි 6.1.3 හි සඳහන් අත්‍යවශ්‍ය විෂය 13 හැදෑරීම අවශ්‍ය වන අතර, එම අත්‍යවශ්‍ය විෂය 13; මොඩියුල පාදක ව සහ ශිෂ්‍ය සහභාගීත්වය සහිත ව සිදු කෙරේ.

6.1.2 වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල

සෑම වාරයක් සඳහා ම 6.1.3 හි සඳහන් වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල අතුරින් එක් විෂයයක් තෝරා ගත යුතු ය. පාසලේ සිටින සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව/ගුරුවරුන් ලබාගැනීමේ හැකියාව, ඉගෙනුම් සම්පත්, යටිතල පහසුකම් සහ ප්‍රදේශයේ අධ්‍යාපනික අවශ්‍යතාව ආදී මානව සහ භෞතික සම්පත් පැවතීම මත පදනම් ව පිරිනමනු ලබන වරණීය/තෝරා ගත හැකි විෂය සංඛ්‍යාව තීරණය කිරීමට පාසල්වලට හැකියාව ඇත.

6.1.3 කනිෂ්ඨ ද්විතීයික මට්ටම (6-9 ශ්‍රේණි) - පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර යටතේ වර්ගීකරණය කරන ලද විෂය

අත්‍යවශ්‍ය විෂය	සම්භාර (credits)	වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල	සම්භාර (credits)
මව් භාෂාව සහ සාහිත්‍යය (සිංහල/දෙමළ)	3	1. අතිරේක ගණිතය (S/T/E) 2. අතිරේක විද්‍යාව (S/T/E) 3. ව්‍යවහාරික තාක්ෂණවේදය[3] (S/T) 4. ව්‍යවහාරික ඩිජිටල් තාක්ෂණය (S/T/E) 5. භාෂා රසාස්වාදය සිංහල භාෂා රසාස්වාදය දෙමළ භාෂා රසාස්වාදය ඉංග්‍රීසි භාෂා රසාස්වාදය 6. සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය (S/T/E) (මෙය 8 ශ්‍රේණියේ සිට ආරම්භ වේ) සෑම වාරයක් සඳහා ම වරණීය/තෝරා ගත හැකි විෂය අතුරින් එක් විෂයයක් තෝරා ගත යුතු ය.	1
ඉංග්‍රීසි භාෂාව	3		
ගණිතය (S/T/E)	3		
විද්‍යාව (S/T/E)	3		
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය (S/T/E)	2		
ආගම[1]	2		
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (S/T/E)	2		
ජීවිතය සඳහා තාක්ෂණවේදය (S/T)	2		
සමාජ අධ්‍යයනය (ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය) (S/T/E)	3		
දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ)	1		
සෞන්දර්ය අධ්‍යාපනය[2]	2		
ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (S/T/E)	1		
ක්‍රීඩා, සමාජ සහ සංගම්/සමාජ සේවා/***වෘත්තීය සූදානම සහ ජීවන කුසලතා	2		
මුළු එකතුව	**29**		**1**

S - සිංහල මාධ්‍යය T- දෙමළ මාධ්‍යය E- ඉංග්‍රීසි මාධ්‍යය

6.1.3.1 ***වෘත්තීය සූදානම සහ ජීවන කුසලතා විෂයය 7 ශ්‍රේණියේ සිට හඳුන්වා දෙනු ලැබේ.

6.1.3.2 ආගම[1] විෂයය යටතේ පහත විෂය හැදෑරීමට අවස්ථාව පවතී.

1. බුද්ධ ධර්මය (සිංහල මාධ්‍ය)
2. කතෝලික ධර්මය (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)
3. ක්‍රිස්තියානි ධර්මය (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)
4. ශෛවනෙරි (දෙමළ මාධ්‍ය)
5. ඉස්ලාම් (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)

6.1.3.3 සෞන්දර්ය අධ්‍යාපනය[2] යටතේ පහත සඳහන් විෂය අතරින් එක් විෂයයක් තෝරා ගත යුතු ය.

1. පෙරදිග සංගීතය (සිංහල මාධ්‍ය)
2. කර්ණාටක සංගීතය (දෙමළ මාධ්‍ය)
3. බටහිර සංගීතය (ඉංග්‍රීසි මාධ්‍ය)
4. දේශීය නර්තනය (සිංහල මාධ්‍ය)
5. භරත නාට්‍යම් (දෙමළ මාධ්‍ය)
6. නාට්‍ය හා රංග කලාව (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)
7. චිත්‍ර කලාව (සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය)

6.1.3.4 ව්‍යවහාරික තාක්ෂණය[3]

ව්‍යවහාරික තාක්ෂණය විෂයය යටතේ මොඩියුල පහක් පවතින අතර, මෙම විෂය තෝරා ගන්නා සිසුවෙකුට පහත මොඩියුල අතරින් එකක් තෝරා ගත හැකි ය.

1. තේ කර්මාන්තය
2. පොල් කර්මාන්තය
3. ජලජ සම්පත්
4. මැණික් හා ස්වර්ණාභරණ (7 ශ්‍රේණියේ සිට වෙන වෙන ම මොඩියුල දෙකක් ලෙස ක්‍රියාත්මක කෙරේ)
5. විදුලි හා ඉලෙක්ට්‍රොනික

6.1.3.5 අත්‍යවශ්‍ය මොඩියුල අතුරින්, ක්‍රීඩා/සමාජ හා සංගම්/සමාජ සේවා/වෘත්තීය සූදානම සහ ජීවන කුසලතා ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමේ දී සිසුන්ගේ විශේෂ තත්ත්ව හා ශාරීරික/මානසික යෝග්‍යතාව පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

7.0 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව සංශෝධිත ජාතික විෂයමාලා රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වන අන්තර්කාලීන විධිවිධාන

7.1 සංශෝධිත ජාතික විෂයමාලා රාමුව ක්‍රියාත්මක කිරීමේ මුල් අදියරේ දී එනම් 2027 සහ 2028 වර්ෂවල 6 ශ්‍රේණිය සඳහා සංක්‍රාන්ති කාල සීමාවක් ලෙස අන්තර්කාලීන විධිවිධාන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර 2026 වර්ෂයේ දී 6 ශ්‍රේණිය නව විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා ලබා දෙන ලද ඉගෙනුම් මොඩියුල 2027 සහ 2028 වර්ෂ සඳහා භාවිත කරනු ලැබේ.

7.2 ඒ අනුව 2027 සහ 2028 වර්ෂවල 6 වන ශ්‍රේණිය සඳහා පාසල් කාල සටහන සකස් කිරීමේ දී විෂය සහ සතියකට වෙන් වන කාලච්ඡේද සංඛ්‍යාව සම්බන්ධ ව මෙම චක්‍රලේඛයෙහි 5.0 වගුවේ සඳහන් කර ඇති උපදෙස් අනුගමනය කළ යුතු අතර අත්‍යවශ්‍ය සහ වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල පහත පරිදි වේ.

7.3 6 ශ්‍රේණිය අන්තර්කාලීන විධිවිධාන යටතේ වර්ගීකරණය කරන ලද විෂය සහ සම්භාර

අත්‍යවශ්‍ය විෂය	සම්භාර (credits)	වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල	සම්භාර (credits)
මව් භාෂාව සහ සාහිත්‍යය (සිංහල/දෙමළ)	3	1. ගණිතය (S/T/E) 2. විද්‍යාව (S/T/E) 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (S/T/E) 4. ව්‍යවහාරික තාක්ෂණවේදය[4] (S/T) 5. ඉතිහාසය (S/T/E) 6. සාහිත්‍ය රසාස්වාදය සිංහල සාහිත්‍ය රසාස්වාදය දෙමළ සාහිත්‍ය රසාස්වාදය ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය සෑම පාසල් වාරයක් සඳහා ම වරණීය/තෝරා ගත හැකි විෂය අතුරින් එක් වරණීය විෂයයක් පමණක් තෝරා ගත යුතු අතර එම විෂයයට අදාළ මොඩියුල අතරින් එක් මොඩියුලයක් පමණක් එම පාසල් වාරය තුළ දී හැදෑරිය යුතු ය.	1
ආගම[1]	2		
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (S/T/E)	2		
ජීවිතය සඳහා තාක්ෂණවේදය (S/T)	2		
සමාජ අධ්‍යයනය (ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය) (S/T/E)	3		
දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ)	1		
සෞන්දර්ය අධ්‍යාපනය[2]	2		
ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව (S/T/E)	1		
ක්‍රීඩා, සමාජ සහ සංගම්/ සමාජ සේවා[3] (S/T/E)	2		
මුළු එකතුව	**29**		**1**

S - සිංහල මාධ්‍යය T- දෙමළ මාධ්‍යය E- ඉංග්‍රීසි මාධ්‍යය

7.3.1 ආගම[1] විෂයය යටතේ මෙහි 6.1.3.2හි සඳහන් විෂය හැදෑරීමට අවස්ථාව පවතී.

7.3.2 සෞන්දර්ය අධ්‍යාපනය[2] යටතේ මෙහි 6.1.3.3හි සඳහන් විෂය හැදෑරීමට අවස්ථාව පවතී.

7.3.3 ක්‍රීඩා, සමාජ සහ සංගම්/සමාජ සේවා[3] යටතේ පහත සඳහන් විෂය හැදෑරීමට අවස්ථාව පවතී.

7.3.3.1 ගෝලීය අධ්‍යයනය

7.3.3.2 සමාජ සේවා

7.3.4 ව්‍යවහාරික තාක්ෂණවේදය[4] විෂයය යටතේ පහත සඳහන් මොඩියුල හැදෑරීමට අවස්ථාව පවතී.

1. තේ කර්මාන්තය
2. පොල් කර්මාන්තය
3. මැණික් හා ස්වර්ණාභරණ
4. ජලජ සම්පත්
5. විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය

7.3.5 වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල අධ්‍යයන වර්ෂය තුළ දී ක්‍රියාත්මක කළ යුතු අතර පාසලේ සිටින සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව/ගුරුවරුන් ලබාගැනීමේ හැකියාව, ඉගෙනුම් සම්පත්, යටිතල පහසුකම් ආදී මානව සහ භෞතික සම්පත් පැවතීම මත පදනම්

ව පිරිනමනු ලබන වරණීය/තෝරා ගත හැකි විෂය/මොඩියුල සංඛ්‍යාව තීරණය කිරීමට පාසල්වලට හැකියාව ඇත.

8.0 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ 6 -9 ශ්‍රේණි සඳහා ඉගෙනුම් කාලය

අන්තර්ගතය මත පදනම් ව වාරයක් සඳහා සම්භාර එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ හිමි වන ආකාරයට විෂය සකස් වී ඇත. විෂය අන්තර්ගතය මොඩියුල ලෙස සකස් කර ඇති අතර, සෑම විෂයයකට ම අවම වශයෙන් එක් වාරයකට එක් මොඩියුලයක්වත් ඇතුළත් වී ඇත. සම්භාර එකක් උපයා ගැනීම සඳහා ඉගෙනුම් පැය දහයක් (මිනිත්තු 600ක්) අවශ්‍ය වේ. මෙයට පන්ති කාමරය තුළ දී සිදු කෙරෙන ගුරු-සිසු සෘජු සන්නිවේදන ඉගෙනුම් පැය සහ සිසුන්ගේ ස්වාධීන ඉගෙනුම් පැය ඇතුළත් වේ.

ඇතැම් මොඩියුල සඳහා වැඩි ස්වාධීන ඉගෙනුම් කාලයක් සහ තවත් සමහර මොඩියුල සඳහා වැඩි ගුරු-සිසු සෘජු සන්නිවේදන ඉගෙනුම් කාලයක් අවශ්‍ය විය හැකි ය. එබැවින් ඇතැම් විෂය සඳහා ගුරුවරයාගේ සෘජු මැදිහත් වීම වැඩි වශයෙන් අවශ්‍ය වන අතර එවැනි විෂය සඳහා වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක් වෙන් කර ඇත.

9.0 ප්‍රාථමික ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

9.1 ප්‍රාථමික දෙවන ප්‍රධාන අවධිය (3 -4 ශ්‍රේණි) සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2027 වර්ෂයේ 3 සහ 4 ශ්‍රේණි සඳහා සහ 2028 වර්ෂයේ 4 ශ්‍රේණිය සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කෙරෙන අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන් වන ආකාරය පහත පරිදි වේ. 3 සහ 4 ශ්‍රේණි සඳහා පාසල් පැවැත්වෙන කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 1.00 දක්වා වේ.

ඉගෙනුම් ක්ෂේත්‍ර	කාලය (සතියකට)
මව්බස	පැය 5
ගණිතය	පැය 5
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්	පැය 5 මිනිත්තු 40
ඉංග්‍රීසි	පැය 3 මිනිත්තු 20
ආගම	පැය 2
දෙවන ජාතික භාෂාව	පැය 1
උදෑසන රැස්වීම සහ ආගමික වතාවත්	පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්)
විවේකය	පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව 7.30 – 8.30 අතර මිනිත්තු 15 ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්)
ශරීර සුවතා ක්‍රියාකාරකම්	පැය 1 මිනිත්තු 40 (දිනකට මිනිත්තු 20 බැගින්)
විෂය සමගාමී ක්‍රියාකාරකම්	මිනිත්තු 30
සතියකට මුළු කාලය	**පැය 27 මිනිත්තු 30**

9.2 ප්‍රාථමික තෙවන ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2029 වර්ෂය දක්වා 5 ශ්‍රේණිය සඳහා පැරණි විෂයමාලාව ක්‍රියාත්මක කෙරෙන අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන් වන ආකාරය පහත පරිදි වේ. 5 ශ්‍රේණිය සඳහා පාසල් පැවැත්වෙන කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 දක්වා වේ.

ඉගෙනුම් ක්ෂේත්‍ර	කාලය (සතියකට)
මව්බස	පැය 5
ගණිතය	පැය 5
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්	පැය 7 මිනිත්තු 30
ඉංග්‍රීසි	පැය 3 මිනිත්තු 05
ආගම	පැය 2
දෙවන ජාතික භාෂාව	පැය 1
උදෑසන රැස්වීම සහ ආගමික වතාවත්	පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්)
විවේකය	පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 – 8.30 අතර මිනිත්තු 15ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්)
ශරීර සුවතා ක්‍රියාකාරකම්	පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 බැගින්)
විෂය සමගාමී ක්‍රියාකාරකම්	මිනිත්තු 30
වෛකල්පිත ක්‍රියාකාරකම්	මිනිත්තු 30
සතියකට මුළු කාලය	**පැය 30**

10.0 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6-9) සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2027 වර්ෂයේ දී 7, 8 සහ 9 ශ්‍රේණි සඳහා ද, 2028 වර්ෂයේ දී 8 සහ 9 ශ්‍රේණි සඳහා ද, 2029 වර්ෂයේ දී 9 ශ්‍රේණිය සඳහා ද පැරණි විෂය නිර්දේශයට අනුව පහත පරිදි පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

විෂය	සතියකට වෙන් වන කාලච්ඡේද සංඛ්‍යාව
ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි /ඉස්ලාම්)	2
සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය	5
ඉංග්‍රීසි	5
ගණිතය	5
විද්‍යාව	5
ඉතිහාසය	2
භූගෝල විද්‍යාව	2
පුරවැසි අධ්‍යාපනය	2
සෞන්දර්ය විෂය	3
ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා	3
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	2
දෙවන භාෂාව ලෙස සිංහල/ දෙමළ	2
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	1
පුස්තකාල භාවිතය	1
මුළු එකතුව	**40**

11.0 කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (6-9) පැරණි විෂයමාලාව යටතේ ක්‍රියාත්මක වන විෂය

1.ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි/ඉස්ලාම්)
2.සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය
3.ඉංග්‍රීසි
4.ගණිතය

5.විද්‍යාව
6.ඉතිහාසය
7.භූගෝල විද්‍යාව
8.පුරවැසි අධ්‍යාපනය
9.සෞන්දර්ය විෂය
10. ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා
11. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
12. දෙවන භාෂාව ලෙස සිංහල/දෙමළ

- සෞන්දර්ය විෂයය යටතේ පහත සඳහන් විෂය අතරින් එක් විෂයයක් තෝරා ගත යුතු ය.
    1. පෙරදිග සංගීතය
    2. කර්ණාටක සංගීතය
    3. බටහිර සංගීතය
    4. දේශීය නර්තනය
    5. භරත නාට්‍යම්
    6. නාට්‍ය හා රංග කලාව
    7. චිත්‍ර කලාව

12.0 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 – 11) ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2027 සහ 2028 වර්ෂවල දී 10 සහ 11 ශ්‍රේණි සඳහා ද, 2029 වර්ෂයේ දී 11 ශ්‍රේණිය සඳහා ද පැරණි විෂය නිර්දේශයට අනුව පහත පරිදි පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

විෂය	සතියකට වෙන් වන කාලච්ඡේද සංඛ්‍යාව
ආගම (බුද්ධ ධර්මය/ කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ශෛවනෙරි / ඉස්ලාම්)	2
සිංහල භාෂාව හා සාහිත්‍යය/ දෙමළ භාෂාව හා සාහිත්‍යය	5
ගණිතය	6
ඉංග්‍රීසි	5
ඉතිහාසය	3
විද්‍යාව	6
පළමු වන විෂය කාණ්ඩයේ විෂය	3
දෙවන විෂය කාණ්ඩයේ විෂය	3
තෙවන විෂය කාණ්ඩයේ විෂය	3
පුස්තකාල භාවිතය	1
වෙන් නොකරන ලද කාලච්ඡේද	3
මුළු එකතුව	**40**

වෙන් නොකරන ලද කාලච්ඡේද 03න් එක් කාලච්ඡේදයක් ශාරීරික අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතු අතර ඉතිරි කාලච්ඡේද පාසලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විෂය, වෙනත් අධ්‍යයන කාර්ය, සිංහල හෝ ඉංග්‍රීසි හෝ සාහිත්‍ය සංගම් වැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සුදුසු පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

13.0 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10 – 11) පැරණි විෂයමාලාව යටතේ ක්‍රියාත්මක වන විෂය

13.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වන පැරණි විෂයමාලාව, හර විෂය හා කාණ්ඩ විෂය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය. හර විෂය 06කි. කාණ්ඩ විෂය; කාණ්ඩ 03ක් යටතේ ගොනු කර ඇති අතර එම කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයකින් එක් විෂයයක් බැගින් විෂය 03ක් තෝරා ගත යුතු වේ. මේ අනුව සියලු ම සිසුන් හර විෂය 06ක් හා කාණ්ඩ විෂය 03ක් ඇතුළු ව විෂය 09ක් හැදෑරිය යුතු වේ.

13.1.1 හර විෂය

සියලු ම සිසුන් මෙම විෂය 06ම හැදෑරිය යුතු ය.

1. ආගම (බුද්ධ ධර්මය/කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය/ශෛවනෙරි/ඉස්ලාම්)
2. සිංහල භාෂාව හා සාහිත්‍යය /දෙමළ භාෂාව හා සාහිත්‍යය
3. ගණිතය
4. ඉංග්‍රීසි
5. ඉතිහාසය
6. විද්‍යාව

13.1.2 කාණ්ඩ විෂය

පහත සඳහන් විෂය කාණ්ඩවලින් එක් කාණ්ඩයකින් එක් විෂයයක් පමණක් තෝරා ගත යුතු ය.

13.1.2.1 පළමු විෂය කාණ්ඩය

1. භූගෝල විද්‍යාව
2. පුරවැසි අධ්‍යාපනය
3. ව්‍යවසායකත්ව අධ්‍යයනය
4. සම්භාව්‍ය භාෂා හා නූතන භාෂා
   (පාලි/සංස්කෘත/ප්‍රංශ/ජර්මන්/හින්දි/ජපන්/අරාබි/චීන/රුසියන්/කොරියන්)
5. දෙවන භාෂාවක් ලෙස සිංහල/දෙමළ
6. ව්‍යාපාර හා ගිණුම්කරණය

13.1.2.2 දෙවන විෂය කාණ්ඩය

1. පෙරදිග සංගීතය
2. කර්ණාටක සංගීතය
3. බටහිර සංගීතය
4. දේශීය නර්තනය
5. භරත නාට්‍යම්
6. නාට්‍ය හා රංග කලාව
7. චිත්‍ර කලාව
8. සාහිත්‍ය රසාස්වාදය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි/අරාබි)

13.1.2.3 තෙවන විෂය කාණ්ඩය

1. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
2. කෘෂි හා ආහාර තාක්ෂණය
3. ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය
4. ශිල්ප කලා
5. ගෘහ ආර්ථික විද්‍යාව
6. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය

7. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
8. නිර්මාණකරණය සහ ඉදිකිරීම් තාක්ෂණවේදය
9. නිර්මාණකරණය සහ යාන්ත්‍රික තාක්ෂණවේදය
10. නිර්මාණකරණය, විදුලිය සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය
9. විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

14.0 12 සහ 13 ශ්‍රේණි සඳහා පැරණි විෂයමාලාව අනුව පාසල් කාලසටහන සකස් කිරීම

2027, 2028, 2029 සහ 2030 වර්ෂවල දී 12 සහ 13 ශ්‍රේණි සඳහා ද, 2031 වර්ෂයේ දී 13 ශ්‍රේණිය සඳහා ද පැරණි විෂය නිර්දේශයට අනුව පහත පරිදි පාසල් කාලසටහන සකස් කර ගත යුතු වේ.

විෂය	සතියකට වෙන්වන කාලච්ඡේද සංඛ්‍යාව	
	12 ශ්‍රේණිය	13 ශ්‍රේණිය
එක් එක් විෂය ධාරාව යටතේ - I විෂය	10	10
එක් එක් විෂය ධාරාව යටතේ - II විෂය	10	10
එක් එක් විෂය ධාරාව යටතේ - III විෂය	10	10
සාමාන්‍ය ඉංග්‍රීසි	6	6
සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT)	2	-
වෙන් නොකරන ලද කාලච්ඡේද	2	4
මුළු එකතුව	**40**	**40**

වෙන් නොකරන ලද කාලච්ඡේද; පාසලේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සිසුන්ගේ අධ්‍යාපන දියුණුවට අදාළ වන කාර්ය සඳහා සුදුසු පරිදි යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

15.0 අ.පොෂ.ස. උසස් පෙළ ශ්‍රේණි (12 – 13) සඳහා පැරණි විෂයමාලාව යටතේ ක්‍රියාත්මක වන විෂය සංයෝජන

12 සහ 13 ශ්‍රේණි සඳහා 2016.04.26 දිනැති අංක 2016/13 දරන අ.පොෂ.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන යන චක්‍රලේඛය, ඊට අදාළ අනෙකුත් සංශෝධිත චක්‍රලේඛ හා උපදෙස් ලිපිවල සඳහන් විෂය සංයෝජන තවදුරටත් ක්‍රියාත්මක කෙරේ.

16.0 ද්වි මාධ්‍ය පන්ති පැවැත්වීම

ද්විතීයික ශ්‍රේණි (6-11) සඳහා ක්‍රියාත්මකවන පැරණි විෂයමාලාව යටතේ ද්වි මාධ්‍ය පන්ති පැවැත්වීම සම්බන්ධව මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024.11.18 දිනැති අංක 34/2024 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් සහ විධිවිධාන තවදුරටත් බලපැවැත්වෙන අතර නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය හැකි විෂය මෙම චක්‍රලේඛයේ 6.1.3 සහ 7.3 යටතේ සඳහන් කර ඇත.

17.0 පොදු කරුණු

17.1 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂය ඉගැන්වීමේ දී විෂය නිර්දේශ සහ මොඩියුලවල සඳහන් උපදෙස්වලට අනුකූල වන පරිදි පාසල්වල ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

17.2 මෙම චක්‍රලේඛයෙහි සඳහන් නව විෂය නිර්දේශයට අදාළ ව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සහ ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර අදාළ නියමිත කාලය තුළ දී පාසල්වලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

17.3 මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් මතු වන ඕනෑ ම ගැටලුවක් පිළිබඳ ව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

17.4 මෙම චක්‍රලේඛයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

17.5 සංශෝධිත ජාතික විෂයමාලා රාමුව මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත. (www.moe.gov.lk)

නාලක කලුවැව
ලේකම්

පිටපත්

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්